**කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 08 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබු අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුලි 30 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය**
**-------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
-----------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
------------------------

**(අ)** 2014 වර්ෂයේදී ලැබුණු ජල බවුසරයේ වටිනාකම නිශ්චය කර ගිණුම්ගත කර නොතිබුණි.

**(ආ)** පුර නැගුම ව්‍යාපෘතියෙන් සමාලෝචිත වර්ෂය තුල සභාවට ලබාදුන් රු.243,304 ක් වටිනා පරිගණක හා උපාංගවල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ණයගැති ශේෂය රු.627,281 ක් සහ ණයහිමි ශේෂය රු.978,752 ක් ලෙස දක්වා තිබුණු නමුත් කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.1,453,108 ක්වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.1,323,268 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

**2.2.1 කඩකුලී**

**සමාලෝචිත වර්ෂය අවසාන වනවිට හිඟ කඩකුලිය** රු.82,202 **ක් වුවත්** 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව ඒවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 මුද්දර ගාස්තු**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129(2)(ආ) වගන්තියේ දැක්වෙන දෙවැනි උපලේඛනයේ සඳහන් පරිදි මුද්දර ගාස්තු ප්‍රමාණය හඳුනාගෙන ප්රාදේශීය සභා අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 උසාවි දඩ මුදල්**

2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.3,500,200 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 නිශ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්**

රු.1,170,000 ක් වටිනාකම වූ ට්‍රැක්ටර්ය සහ අත්ට්‍රැක්ටරයක් වසර 04 කට අධික කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රියව තිබුණු අතර අළුත්වැඩියා කර භාවිතා කිරීමේ හැකියාව පිළිබඳ සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්ක්ෂමතා**

**(අ)** 2014 දෙසැම්බර් 31 දිනට සභාව සතු අක්කර 22.5 ක්වූ ඉඩම්වල අයිතිය පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ අංක 03 හි විධිවිධාන පරිදි සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** සභා බල ප්‍රදේශය තුල පිහිටි අක්කර 130 ක ප්‍රමාණයෙන් යුත් සුසාන භූමි 71 ක් සම්බන්ධයෙන් පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ 2006 නොවැම්බර් 14 දිනැති අංක PL/07/01/53 දරන පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ අංක 9 හි යෝජනා හා නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ඇ)** දිර්ඝ කාලයකට පෙර සභාව වෙත ලැබී තිබුණු ටිපර් රථය හා බවුසරය (203 වන අධිකාරිය) මෝටර් වාහන පනතේ 2 (1) වගන්තිය පරිදි ලියාපදිංචි නොකර ධාවනය කරමින් පැවතුණි.

**4. පද්ධති හා පාලනය**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

**(අ)** ගිණුම්කරණය

**(ආ)** ආදායම් පරිපාලනය.

**(ඇ)** වත්කම් කළමනාකරණය